**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**
**OFFICE ON MISSING PERSONS**

**මාධ්‍ය නිවේදනය** **2019 ජනවාරි මස 07**

**<u>අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සමග සහයෝගීතාවයට නව වැඩසටහනක්</u>**

2018 පෙබරවාරි මස 28 වන දිනට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කර වසරක් සැපිරීම නිමිත්තෙන් "වේදනාව අතුරුදහන් නොවේ. ඔවුන් උදෙසා සත්‍යය සෙවීමේ වගකීම අපි ඉටු කරමු" යනුවෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 ජනවාරි මස 5 වන දින දියත් කරන ලදී. තමන්ගේ පවුල්වල අතුරුදහන් වූ ආදරණීයයන්ට අත් වූ ඉරණම ගැන සත්‍යය දැනගැනීමට නොහැකිව පීඩා විඳිමින් පසු වන ශ්‍රී ලාංකිකයන්ගේ තත්වය සහවේදනයෙන් යුතුව අවබෝධ කරගැනීමට පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන සංවිධානය කර ඇත. බොහෝ කම්කටොලු විඳ දරාගනිමින් ජීවිත ගෙවන පවුල්වල සාමාජිකයන්ගේ අත්දැකීම් මතු කරලීම සඳහා මුද්‍රිත, සමාජ ජාල, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය මාධ්‍යය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

"තම ආදරණීයයන් අතුරුදහන් වීම පවුල් කෙරෙහි අතිශය ව්‍යසනකාරී තත්ත්වයන් ඇති කරයි. එහි බලපෑම් විවිධය. එම අත්දැකීම දැඩි සේ වේදනාකාරීය. සිදු වූ දේ ගැන සත්‍යය දැනගත නොහැකි වීම නිසා ඇතිවන අස්ථාවර බව; වෙන් වූ ආදරණීයයන් වෙනුවෙන් චාරිත්‍රානුකූලව ශෝකය ප්‍රකාශ කිරීමට පවා ඇති නොහැකියාව සහ ඒ තුළින් ඇතිවන මානසික පීඩාව, සෞඛ්‍යය සහ ජීවනෝපාය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම්, මෙම පවුල්වල බහුලව දක්නට ලැබෙන තත්ත්වයන් ය. ඔවුන් ජීවිතය සහ ලෝකය දකින ආකාරය පවා මෙම වේදනාකාරී අත්දැකීම් නිසා වෙනස් විය හැකිය. සත්‍යය දැනගැනීමට මෙම පවුල්වලට ඇති අයිතිය තහවුරු කිරීමට අපට සමාජමය වශයෙන් ද වගකීමක් ඇති බව" අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා අවධාරණය කළේ ය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්වාධීන ආයතනයක් වන අතර ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ දහස් ගණනකගේ ඉරණම පිළිබඳ සත්‍යය සෙවීමේ කාර්යභාරය ඉටු කිරීම සඳහා පිහිටුවනු ලැබුවකි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එක් කණ්ඩායමක් හෝ ජන වර්ගයක් වෙනුවෙන් පමණක් සේවය කරන ආයතනයක් නොවන අතර එය අධිකරණමය යාන්ත්‍රණයක් ද නොවේ. මෙම ආයතනයේ වගකීම පුළුල්ය. මෙයට දකුණේ කැරලිකාරී තත්ත්වයන් දේශපාලන නොසන්සුන්තාවන් පැවති කාල වකවානුවල, උතුරු නැගෙනහිර පැවති යුද්ධය සහ පසුකාලීනව පැවති තත්ත්වයන් යටතේ සහ

ක්‍රියාන්විතයේ නියැළී සිටියදී සිදු වූ අතුරුදහන් වීම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් ආදිය අයත් ය.

"අපගේ වගකීම වන්නේ ජාති, ආගම් හෝ වාසය කරන පළාත යන කරුණු නොතකා මෙම පවුල්වලට අවශ්‍ය පිළිතුරු ලබා දීමය. අපගේ සැලකිල්ල මූලිකවම යොමු වන්නේ වින්දිතයන් කෙරෙහිය. ඔවුන් මුහුණපාන ගැටලු පිළිබඳව දැනුවත් වී අපගේ උත්සාහයන්ට සහය වීම සමස්ත සමාජයටම පැවරෙන වගකීමක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. මෙම පවුල්වලට සත්‍යය සොයාදීමේ නෛතික වගකීම රජයට ඇති නමුත්, ඔවුන්ගේ වේදනාව දුරැලීම සඳහා කටයුතු කිරීමේ සදාචාරාත්මක වගකීම සමාජයක් ලෙස අප වෙත පවතින්නේ යැයි", අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරියක වන විශ්‍රාමික මේජර් ජෙනරාල් මොහාන්ති පීරිස් මහත්මිය පැවසුවාය. මෙම තැනැත්තන් අතුරුදහන් වීමට තුඩු දුන් හේතූන් සහ සිද්ධීන් පිළිබඳ සෙවීම සහ පරීක්ෂණ කිරීම, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සහ වින්දිතයන්ට හානිපූරණය සැලසීම, මරණ සහතික සහ අතුරුදහන් වූ තැනැත්තන් ලියාපදිංචි කර ඔවුන් දක්නට නොමැති බව සනාථ වන සහතික [Certificates of Absence] නිකුත් කිරීමට අවශ්‍ය සහය ලබා දීම සහ ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත සමුදායක් [Database] ස්ථාපනය කිරීම යනාදිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්යභාරයට ඇතුලත් වේ.

"පොදුවේ සමාජයත් විශේෂයෙන් ඇතැම් රාජ්‍ය නිළධාරීනුත් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් මුහුණපාන ගැටලු සහ තත්ත්වයන්ට සංවේදී නොවන බවත් ඔවුන්ට අවශ්‍ය සහයෝගය නොදක්වන බවත් අපට වැටහී ඇති කරුණකි. මොවුන් මුහුණපාන ගැටලු පිළිබඳ තිබෙන්නාවූ දැනුවත්භාවයේ අඩුකමක්ද පොදුවේ දක්නට ලැබේ. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන් හුදෙකලා වී නැති බව අවධාරණය කිරීමට සහ සමාජය තුළ සහයෝගීතාව සහ මහජන අවබෝධය නගා සිටුවීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු යැයි", අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරයකු වන පූ. ජයදීපා මහත්මිය පවසා සිටියේ ය.

අතුරුදහන් කරවීම් වලට ගොදුරු වූ කවරෙකු වුවද මුහුණපාන දැඩි වේදනාව පිළිගැනීමට දක්වන විරෝධය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයට ලක් වී ඇත. මෙවන් තත්ත්වයන් පිළිබඳ මහජන අවබෝධය සහ කාර්යාලයේ කාර්යභාරය පිළිබඳ දැනුවත්භාවය ගොඩ නැංවීමේ අවශ්‍යතාව පැන නැඟී ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්යභාරය සහ මහජනතාව දැනුවත් කිරීමට දියත් කළ මෙම වැඩසටහන පිළිබඳ වැඩිදුර විස්තර සඳහා අපගේ Facebook පිටුවට මෙතැනින් පිවිසෙන්න: https://www.facebook.com/ompsrilanka/